# දැන්වීමයි!

## රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ

# ප්‍රමාණ සමීක්ෂක III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම

1.0 රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රමාණ සමීක්ෂක III ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු 01 ක් සඳහා නිලධරයන් බඳවා ගැනීමට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ප්‍රකාරව අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් පවතින පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

3.0. මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය, තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට නිලධාරීන් යටත් විය යුතු වේ.

4.0 අවශ්‍ය සුදුසුකම්

(අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුයි.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි.

(රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඇ) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මනා කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඉ) අධ්‍යාපන සුදුසුකම්:

(i) සිංහල / දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම හෝ ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) තුන (03) මට්ටමේ කුසලතාවයක් ලබා තිබීම

හා

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා/ ගණිත විෂය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතියීක අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටමට ලබා තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ) හෝ ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (04) මට්ටමේ කුසලතාවයක් ලබා තිබීම.

(ඊ) වෘත්තීය සුදුසුකම්

තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක තාක්ෂණ ක්ෂේත්‍රයේ (ප්‍රමාණ සමීක්ෂක) ජාතික වෘත්තීය කුසලතා (NVQ) හය (06) මට්ටමේ කුසලතාවයක් ලබා තිබීම.

(එ) වෘත්තීය සුදුසුකම් :

ප්‍රමාණ සමීක්ෂක ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද

(ඒ) සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනයේ හෝ ඊට පෙර

හෝ

සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

5.0 වැටුප් පරිමාණය : රු. 30,140-10X350-11X370-10X560-10X660-49,910/= (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව MT2-2016 වැටුප් කේතය අදාළ වේ)

6.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

2021 මාර්තු මස .............. දින ............................................

(දෙපාර්තමේන්තු ප්‍රධානී)

ඒ සඳහා වන අයදුම්පත හා අදාළ කොන්දේසි රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ **www.pubad.gov.lk** වෙබ් අඩවියේ පළ කරනු ලබන අතර, එය සම්පූර්ණ කර 2021.04.10 දින හෝ ඊට පෙර රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07 යන ලිපිනය වෙත යොමු කළ යුතුය.